(අ) දරුවන්ට එරෙහි සියලු ආකාරයේ හිංසන ක්‍රියා සම්පූර්ණයෙන් නතර කිරීම ;

(ආ) හිංසනයට පත් වූවන්ට, සරණාගතයන්ට හා එවැනි සහායක් අවශ්‍ය ළමා, වැඩිහිටි, ආබාධිත හා දිළිඳු ජනයාට සියලු ආකාරයේ මානුෂීය ආධාර බෙදා දීම;

(ඇ) සහභාගීත්ව සංවර්ධනය මගින් කෘෂිකාර්මික, ධීවර, කුඩා ව්‍යවසාය හා ග්‍රාමීය කර්මාන්ත ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම තුළින් ග්‍රාමීය ප්‍රජාවගේ සමාජ ආර්ථික සංවර්ධනය ;

(ඈ) ආදායම් උත්පාදන ක්‍රියාවලි, ස්වයං රැකියා අවස්ථා හා කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු ආකාරයේ උත්සාහයන් ගැනීම මගින් ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම ;

(ඉ) යුද්ධයෙන් පීඩාවට පත් වූ පිරිස් හා සමාජයේ පසුගාමී කණ්ඩායම් තුළ සෞඛ්‍ය, අධ්‍යාපන, ස්ත්‍රී පුරුෂ සමාජභාවයන්, ළමා අයිතිවාසිකම්, අයිතීන් හා රැකවරණයට කැපවීම, ඔවුන්ගේ ධාරිතා වර්ධනයට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කර සමාජ සංවර්ධනයට දායක වීම ;

(ඊ) කාන්තාවන් සවිබල ගන්වමින් ඔවුන්ගේ නායකත්ව කුසලතා සංවර්ධනය කිරීම, සමාජ ආර්ථික සංවර්ධනයට කාන්තාවන් දායක කර ගැනීම සඳහා කාන්තා කණ්ඩායම් ගොඩනැගීම, පවත්වා ගෙන යාම හා ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම ;

(උ) ග්‍රාමීය ප්‍රදේශයන්හි පරිසර සංරක්ෂණයට අදාළ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඌ) පීඩාවට පත්වූ කණ්ඩායම් සඳහා සාමය, අවබෝධය, සහජීවනය සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම ; සහ

(එ) ඉහත සඳහන් පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය හිතකර හෝ ආනුෂංගික විය හැකි වෙනත් සියලු කටයුතු සහ ක්‍රියාමාර්ග ගැනීම;

**4.** (1) මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව සංස්ථාවට — සංස්ථාවේ බලතල.

